(c) www.sinhalalyrics.com

සාධු ජන ගන මනා සභා ගැබ හොබවනා
දැහැන් ගත නොවී මා ගීතයෙන්
සිටින් පුටු කබල් මත සීරුවෙන්
ගී යකඩ ගොඩවල්ය වැයෙන්නේ
කටුක පද පෙලවල්ය ගැයෙන්නේ
දහදියයි ගතපුරා ගලන්නේ මිනිසුන්ය ගයන්නේ වයන්නේ
කම්හලේ බිත්තියේ අඟුරු කැටයෙන් ලියූ
කුරුටු ලිපි මගේ මහ ගී පොතයි
කිවියරන් විසින් නොව දුකට පත් දන විසින්
එ දළ රළු පද බැඳුම් විරචිතයි
ඔබට ගී ගයන මම කෝකිලාවක නොවෙමි
මග තොටේ ඔබ දකින ගැහැණියයි
ගීත නොව මා මුවින් නැගෙන්නේ
තැලී ගිය සුවහසක් ආත්මය හඬනගා
ඉකිබිඳින බැන නගින රාවයයි
නැත අපට ප්‍රතිරූප දේශයක් විඳින්නට අති පවර රස භාව
පෙදෙයි රස හමු විඳින ජනයිනි වනු සමා
ඔබ සවන් පිනවන්ට සමත් ගී දුලබ නම්
කලා මල් යාදා බිඳින්නට විනම් මට
බිඳහලෙම් සැහැසි ලෙස චන්ඩ මැරවරියක්ව යලි කියම්
නැත අපට හඳුවු කාලයක් හඳුවු දේශයක් රාජ්‍යයක්
අනන්ත වූ දුකින් නුව අතැර කව් රස භාව
ගයන්නයට ලද හඬින් කියා සැර පරුෂ වැකි
අප මැරුණ කල අපේ දරුවනේ ගයවු තෙපි වැස හඳ
දේශයක රාජ්‍යයක අප වෙතින් පලා ගිය මධුර ගී

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - ඔස්ටින් මුණසිංහ

(c) www.sinhalalyrics.com